සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. පවිටු ජීවිත රටාවකට යොමු වූ දේව ජනතාවට අදමිටු කමින් මුදවා නැවත දෙවිඳුන් වෙත ගෙන යාමේ කාර්ය ඉටු කළේ,
(1) දේව දූතයන් ය. (2) දිවැසිවරුන් ය. (3) රජවරුන් ය. (4) පරිසිවරුන් ය.

02. ''මෙන්න කන්‍යාවක් ගැබ්ගෙන පුතෙකු බිහිකරන්නීය''උන් වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනු ඇත.'' කිතු උපත පිළිබඳ මෙම ප්‍රකාශය සඳහන් වන්නේ,
(1) උත්පත්ති පොතේ ය. (2) ජොහාන් ශුභාරංචියේ ය.
(3) මතෙව් ශුභාරංචියේ ය. (4) මීකා දිවැසිවරයාගේ පොත් ය.

03. ''සැබවින් ම යුක්තිය ඉටු කරන්නේ ය. එතුමා කලකිරෙන්නේවත් අධෛර්ය වන්නේවත් නැත.'' මෙලෙස ජේසුස් වහන්සේගේ විශිෂ්ඨ මෙහෙවර පිළිබඳව ප්‍රකාශ කළේ,
(1) යෙසායා දිවැසිවරයා ය. (2) මීකා දිවැසිවයරයා ය.
(3) මලාකි දිවැසිවරයා ය. (4) ජෙරමියා දිවැසිවරයා ය.

04. කිතු උපත පිළිබඳ ප්‍රකාශ කර ඇති අනාවැකි අනුව ක්‍රිස්තුන් වහන්සේ සදහටම රජකම් කරනවායැයි පවසන්නේ,
(1) දාවිත්ගේ වංශයට ය. (2) ජුදා වංශයට ය.
(3) ජකොබ්ගේ වංශයට ය. (4) අභියාගේ වංශයට ය.

05. ''බොහෝ දෙනා ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නාහ මන් ද ඔහු ස්වාමීන් අභිමුවේ ශ්‍රේෂ්ඨ වන්නේය.'' මෙම ප්‍රකාශය කා විසින් කා හට පවසන ලද්දක් ද?
(1) ගාබ්‍රියෙල් දේවදූතයා විසින් සෙකරියස්ට. (2) ගාබ්‍රියෙල් දේවදූතයා විසින් මරියතුමීට.
(3) සෙකරියස් විසින් එළිසබෙත්ට. (4) එළිසබෙත් විසින් මරියතුමීට.

06. ඇදහිල්ලෙන් හා විශ්වාසයෙන් කළ දේව කන්නලව්වට දෙවිඳුන් පිළිතුරු දෙන බව සනාථ කළ උපත වන්නේ,
(1) කිතු උපතය. (2) ආබ්‍රහම්ගේ උපතය.
(3) මෝසෙස්ගේ උපතය. (4) ස්නාවක ජොහාන්ගේ උපතය.

07. දාවිත්ගේ නුවර උපන් ක්‍රිස්තුන් නම් ගැලවුම්කරුවාණන් පිළිබඳ දෙවිඳුන් එඬේරුන්ට සැල කළ ලකුණ වන්නේ,
(1) ''පෙරදිගින් පැමිණි ශාන්ත්‍ර වන්නයන් ය.''
(2) ''ගව ඔරුවය''
(3) ''අහසේ පැයූ සුවිශේෂි තාරකාවයි.''
(4) ''ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ය.''

08. ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට සන්තක වීමේ තත්වයට ඇතුළු වූයේ,
(1) චර්මච්ඡේදනයෙනි. (2) බෞතිස්මයෙනි.
(3) කැප කිරීමෙනි. (4) මරණයෙන් උත්ථාන වීමෙනි.

09. මිසරයේ සිටි දේව ජනතාව වහල් බවින් මුදවාගෙන මෝසෙස්ගේ නායකත්වයෙන් කානාන් දේශයට ගෙන ඒමේ සිද්ධිය අනුස්මරණය කළේ,
(1) කූඩාරම් මංගල්‍යය තුළින් ය. (2) පාස්කු මංගල්‍යය තුළින් ය.
(3) එඬේර මංගල්‍යය තුළින් ය. (4) පෙන්තකොස්ත මංගල්‍යය තුළින් ය.

10. කැප කිරීමේ පිළිවෙත ඉටු කිරීමට ජේසු බිළිඳු රැගෙන දේව මාළිගාවට පැමිණි අවස්ථාවේ දී හමු වූ දිවැසිවරිය වන්නේ,
(1) දෙබෝරා ය. (2) අන්නා ය. (3) හන්නා ය. (4) එස්තර් ය.

11. රෝම අධිරාජ්‍ය පාලනයට ජනතාව විරුද්ධ වීමට බලපෑ ප්‍රධාන හේතුව වූයේ,
(1) සෙනඟ පිට බදු බර පැටවීම ය. (2) දේව නමස්කාරය තහනම් කිරීම ය.
(3) අධිරාජ්‍යයා සුළු කොටස සැලකීම ය. (4) රැකියා අවස්ථා අහිමි කළ නිසා ය.

12. ස්නාවක ජොහාන් තුමාගේ කාලයේ ජුදා ආගමික උත්තම පූජක පදවිය ලබා සිටියේ,
(1) අන්නායස් ය. (2) සයිරස් ය. (3) කායපස් ය. (4) අරිස්තාර්කස් ය.

13. එකිනෙකාගේ අවශ්‍යතා සපුරා නව ජීවිත පරිවර්තනයක් සඳහා ස්නාවක ජොහාන් තුමා අභියෝග කළේ,
(1) පොදු ජනතාවටය. (2) රාජ්‍ය සේවයේ යෙදී සිටි අයට ය.
(3) ආරක්ෂක අංශයටය. (4) ජුදා ආගමික ජනතාවටය.

14. කමත හොඳහැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පොලා සිය අටුවේ රැස්කරන පිණිසත් උන්වහන්සේගේ අතේ කුල්ල ඇත.'' මෙයින් අරුත් ගැන්වෙන්නේ,
(1) පාපය මිනිසා විනාශයට පත්කරන බවයි.
(2) කුල්ල අයහපත යහපතින් වෙන් කරන බවයි.
(3) විනිශ්චය කිරීමේ බලය ජේසුස්වහන්සේ සතුව ඇති බව.
(4) කමත ධාන්‍ය රැස් කිරීමට යොදා ගතහැකි බවයි.

15. ජේසුස් වහන්සේ නාසරෙත්හි ධර්ම ශාලාවේ දී කියවනු ලැබූ ග්‍රන්ථය වන්නේ,
(1) උත්පත්ති පොත ය. (2) යෙසායාගේ පොත ය.
(3) මලාකි පොත ය. (4) නික්මයාම පොත ය.

16. ''ප්‍රේරිත'' යන්නෙහි අර්ථය වන්නේ,
(1) විශේෂාකාරයෙන් තෝරාගත් යන්නයි.
(2) දෙවිඳුන්ගේ හදවතට එකඟව ජීවත්වන්නන් යන්නයි.
(3) විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කර යවනු ලැබූ යන්නයි.
(4) දේව කැඳවීම ලැබූ තැනැත්තන් යන්නයි.

17. ''ගර්ජනාවේ පුත්‍රයන්'' ලෙස හැඳින් වූ ජේසුතුමාගේ ශ්‍රාවකයින් දෙදෙනා වන්නේ,
(1) පේදුරු හා ඇන්ඩෘය. (2) මතෙව් හා ජුදස් ය.
(3) තෝමස් හා පිලිප් ය. (4) ජාකොබ් හා ජොහාන් ය.

18. වැඩිමහල්ලන් හා නායක පූජකයන් පත්කරනු ලැබුවේ,
(1) පරිසිවරුන් අතරිනි. (2) සද්දුසිවරු අතරිනි.
(3) සෙලට්වරු අතරිනි. (4) විනයධරයන් අතරිනි.

19. ''රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් වැඩක් නැත.'' මෙම ප්‍රකාශය ජේසුතුමා කරනු ලැබුවේ,
(1) මතෙව්ගේ නිවසේ දී ය. (2) සීමොන්ගේ නිවසේ දී ය.
(3) සාකෙවුස්ගේ නිවසේ දී ය. (4) මාර්තාගේ නිවසේ දී ය.

20. ''ස්වාමිනී මා ඔබගේ උපකරණයන් කරගත මැනව'' මෙලෙස යාච්ඤා කළේ,
(1) පාවුල් තුමා ය. (2) ඇසීසියේ ෆැන්සිස් තුමා ය.
(3) ස්නාවක ජොහාන් තුමා ය. (4) ජේසුස් වහන්සේ ය.

21. ජුදෙව් ජන සමාජය තුළ තෙලින් ආලේපය කර කැඳවීම ලබාදුන් ජන කණ්ඩායම් දෙක සඳහන් පිළිතුර වන්නේ,
   (1) රජවරු හා විනයධරයන් ය.
   (2) රජවරු හා පූජකවරු ය.
   (3) පූජකවරු හා පරිසිවරු ය.
   (4) පූජකවරු හා සද්දුසිවරු ය.

22. සීමොන් නම් පරිසිවරයාගේ නිවසේ දී ජේසුතුමාට මුණ ගැසුනේ,
   (1) සමාරි ස්ත්‍රිය යි.
   (2) මාර්තා හා මරියා යි.
   (3) පව්කාර ස්ත්‍රිය යි.
   (4) කුදු ස්ත්‍රිය යි.

23. ජුදෙව්වන් විසින් දේශ ද්‍රෝහීන් හා පව්කරුවන් ලෙස සලකා පිළිකුල් කළ ජන කණ්ඩායම වන්නේ,
   (1) අයකැමියන් ය.
   (2) ලාදුරු රෝගීන් ය.
   (3) එඬේරුන් ය.
   (4) පරිසිවරුන් ය.

24. ජේසුතුමා රාජ තේජසින් ජෙරුසලමට යාම තුළින් ඉටු වූයේ,
   (1) යෙසායාගේ දිවැස් වැකියකි.
   (2) මීකාගේ දිවැස් වැකියකි.
   (3) ජෙමියාගේ දිවැස්වැකියකි.
   (4) සෙකරියස්ගේ දිවැස් වැකියකි.

25. ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියා කරන ජුදෙව් ජනයා අවදි කිරීමට ජේසුස් වහන්සේ කළ ක්‍රියාව වන්නේ,
   (1) පන්දහසකට කෑම දීමය.
   (2) රාජ තේජසින් ජෙරුසලමට ඇතුළු වීමයි.
   (3) ශ්‍රාවකයන් සමඟ රොටී කැඩීමයි.
   (4) දේව මාළිගාව පවිත්‍ර කිරීමයි.

26. ''මිත්‍රය ඔබේ පව් කමා කරන ලදී'' ජේසුතුමා මෙම ප්‍රකාශය කරනු ලැබුවේ.
   (1) ලාදුරු රෝගීන් සුව කිරීමේ දී ය.
   (2) අංශභාග රෝගියා සුව කිරීමේ දී ය.
   (3) අන්ධ බාර්තලමේයස් සුව කිරීමේ දී ය.
   (4) අතක් පණනැති මිනිසා සුව කිරීමේ දී ය.

27. ජේසුස් වහන්සේ ඔලීව කන්දෙහි කළ යාච්ඤාවේ හරය වන්නේ,
   (1) ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා'' යන්නයි.
   (2) පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරනන් යන්නයි.
   (3) යාච්ඤාව තුළින් දේව කැමැත්තට කීකරු වන්නේ යන්න යි.
   (4) අනන්‍යන්ගේ යහපත උදෙසා දේවා කැමැත්තට එකඟවන්න යන්න යි.

28. ජේසුස් වහන්සේව පාවා දීමෙන් පසු දේව මාළිගාවේ මුර සෙබළුන් විසින් ගෙනයනු ලැබුවේ,
   (1) හෙරොද් රජතුමා ළඟට ය.
   (2) උත්තම පූජක මැඳුරට ය.
   (3) පිළාත් ළඟට ය.
   (4) ශ්‍රේෂ්ඨාධිකරණයට ය.

29. ජේසුස් වහන්සේගේ උත්ථානයේ ශුභාරංචිය සමාජගත කරන කිතුනුවා,
   (1) මංසන්ධි වල දේශනා කළ යුතු ය.
   (2) ශුද්ධාත්මදානය පිළිබඳ ප්‍රචාරය කළ යුතු ය.
   (3) හිස් වූ සොහොනේ පින්තූර ප්‍රදර්ශනයට කළ යුතු ය.
   (4) ක්‍රිස්තුන් වහන්සේ ගැන ජීවිතයෙන් සාක්ෂි දැරිය යුතු ය.

30. ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට උදව් කළේ,
   (1) අරිමාතියේ ජොසෙප් ය.
   (2) සිරේනියේ සීමොන් ය.
   (3) සිරේනියේ ජෝසෙප් ය.
   (4) අරිමානියේ සීමොන් ය.

31. ජුදෙව් ප්‍රධානීන් ජේසුතුමාව පිලාත් වෙත ගෙන ගියේ,
   (1) එතුමාට රෝම පුරවැසිභාවය නොතිබූ නිසා ය.
   (2) එතුමා රෝම රජයට බදු නොගෙවීම නිසා ය.
   (3) එතුමා රෝම අධිරාජ්‍යයා විවේචනය කළ නිසා ය.
   (4) එතුමා මරණයට පත් කිරීමට ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණයට බලය නොතිබූ නිසා ය.

32. එම්මාවුන් ගමට ගිය ශ්‍රාවකයන් උත්ථාන වූ ජේසුස් වහන්සේ හඳුනාගනු ලැබුවේ.
   (1) එම්මාවුස් ගමට යන අතරමගදී ය.
   (2) ශුද්ධ ලියවිලි පහදා දෙන මොහොතේ දී ය.
   (3) රොටී ආශිර්වාද කර ඔවුන්ට දුන් මොහොතේ දී ය.
   (4) උන්වහන්සේ මුණ ගැසුනු අවස්ථාවේ දී ය.

33. කිතුනුවන් වන අපහට ශුද්ධාත්මදානය නැමැති දේව වරප්‍රසාදාය හිමිවන්නේ,
   (1) බෞතිස්මයේ දී ය. (2) උපතේ දී ය.
   (3) ස්ථිර වීමේ දී ය. (4) ශුද්ධ වූ විවාහයේ දී ය.

34. ''මේ මනුෂ්‍යයා අත කිසි වරදක් මට නොපෙනේ'' මෙසේ ප්‍රකාශ කළේ,
   (1) හෙරොද් රජතුමා ය.
   (2) පිලාත් ආණ්ඩුකාරයා ය.
   (3) හේවායන් ය.
   (4) පාරාවෝ රජතුමා ය.

35. ජේසුස් වහන්සේ කුරුසපත් වූ අවස්ථාවේ දී සොබාදහම දැක් වූ පුදුමාකාර ප්‍රතිචාරය වූයේ,
   (1) හිරු දීප්තිමත් ව බැබලීම යි.
   (2) වර්ෂාව ඇතිවීම යි.
   (3) තද සුළං ඇති වීම යි.
   (4) රටපුරා අන්ධකාර වී හිරු අඳුරු වීම යි.

36. පසුතැවිලි වී ජොර්දාන් ගඟේ බෞතිස්ම ලැබීමට ජනතාව කැඳවනු ලැබුවේ.
   (1) ජේසුස් වහන්සේ ය. (2) දෙවියන් වහන්සේ ය.
   (3) ස්නාවක ජොහාන් ය. (4) මලාකි දිවැසිවරයා ය.

37. ජේසුතුමාගේ මෘත දේහය පිලාත්ගෙන් ඉල්ලීමට තරම් එඩිතර වූයේ,
   (1) අරිමාරියේ ජෝසෙප් ය. (2) කිරේනියේ සීමොන් ය.
   (3) ක්ලේයෝපාස් ය. (4) එතියෝපීය නපුංසකයා ය.

38. වර්තමාන සමාජයේ යුක්තියට පිටු පා තම ජනප්‍රියතාවය ඉස්මතු කර ගැනීමට ක්‍රියා කරන අය සමාන වන්නේ,
   (1) උත්තම පූජකයාට ය. (2) රෝම අධිරාජ්‍යයාට ය.
   (3) පිලාත් ආණ්ඩුකාරවරයාට ය. (4) විනයධරයන්ට ය.

39. අපට පැමිණෙන ප්‍රශ්න ගැටළු යාච්ඤාවෙන් හා දේව වචනයෙන් ජයගත හැකි බව ජේසුතුමා පෙන්වා දුන්නේ,
   (1) ගෙත්සෙමන යාච්ඤාවෙන් ය.
   (2) පරිසිවරයාගේ නිවසේ යාච්ඤාවෙන් ය.
   (3) කුරුසගසේ යාච්ඤාවෙන් ය.
   (4) පාළුකරයේ නිරාහාර යාච්ඤාවෙන් ය.

40. කිතුනු බෞතීස්ම ස්නාපනය තුළ ශුද්ධාත්මයාණන් වැඩ සිටීම මඟින් අත්දකිනුයේ,
   (1) ජනතාවගේ සිත් පවිත්‍ර කිරීමකි.
   (2) තම ජීවිතයේ නව්‍යයතාවයකි.
   (3) පාපය දවාලීමකි.
   (4) තම දිවියේ කරදර වලින් මිදීමකි.

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **ක්‍රිස්තියානි ධර්මය - II** | කාලය පැය 02 යි
අමතර කාලය මිනිත්තු 10 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01. කෙටි පිළිතුරු සපයන්න.
    (1) දේව සැලැස්මට අවනත වූ ක්‍රිස්තු උපතට අදාළ චරිත දෙකක් නම් කරන්න.
    (2) ජුදෙව්වන් විසින් ඉටු කළ චාරිත්‍ර දෙකක් ලියන්න.
    (3) රෝම අධිරාජ්‍යයට යටත් වූ ප්‍රදේශ හතරක් ලියන්න.
    (4) ස්නාවක ජොහාන්තුමා තුළ තිබූ සරල ජීවිත ක්‍රමය පෙන්නුම් කරන කාරණා දෙකක් ලියන්න.
    (5) නාසරෙත් හි දේශනාවේ දී ජේසුස් වහන්සේ ගෙනහැර දැක් වූ ජුදා සමාජය තුළ භාවිත වූ ප්‍රස්ථා පිරුළු දෙක නම් කරන්න.
    (6) ශ්‍රාවකයන් 70 දෙනා පිටත් කර හැරීමේ දී ඔවුන්ට ජේසුස් වහන්සේ ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.
    (7) ආබ්‍රහම්ගේ පුත්‍රයා හා ආබ්‍රහම්ගේ දියණිය ලෙස ජේසුස් වහන්සේ හැඳින් වූ පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.
    (8) ජුදෙව් ජනතාවට ගෙවීමට නියම වී තිබූ බදු වර්ග දෙක නම් කරන්න.
    (9) ''යළිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න.'' මෙසේ ප්‍රකාශ කළේ කවුරු විසින් කා හට ද?
    (10) පේදුරුගේ මහා ප්‍රකාශය ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

02. (1) ස්නාවක ජොහාන්තුමාගේ උපත පිළිබඳ සුභාරංචිය දන්වනු ලැබුයේ කවුරුන් විසින් කා හට ද?
    (2) ස්නාවක ජොහාන්ගේ උපත පිළිබඳ සුභාරංචියේ පුවත ප්‍රකාශ කරන විට,
        (අ) උපත පිළිබඳ පිණිවිඩය ඇසූ තැනැත්තා සිටියේ කුමන ස්ථානයක ද?
        (ආ) කුමන කාර්යක නිරත වී සිටියේ ද?
        (ඇ) උපත පිළිබඳ අසනු ලැබූ සුභාංරචිය අවිශ්වාස කිරීම හේතුවෙන් ලද දඬුවම කුමක් ද?
    (3) දේව සේවයේ යෙදෙන කිතුණු ඔබ ක්‍රියා කළ යුතු ආකාර පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. ''මරන්න ගෙන යන බැටළුවකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට ගොළුව සිටින බැටළුවකු මෙන් ද උන් වහන්සේ මුඛය නාරින සේක.''
    (1) ඉහත ශුද්ධ ලියවිලි පාඨය කවුරුන් විසින් කා හට පහදා දෙනු ලැබුවක් ද?
    (2) එම පාඨය තුළ ගැබ්ව ඇති කරුණු අනුව ජේසුස් වහන්සේ තුළ දැකිය හැකි චරිත ලක්ෂණ තුනක් ලියන්න.
    (3) යහපත් සමාජයක් ගොඩ නැගීමට අප තුළ වර්ධනය කරගත යුතු චරිත ලක්ෂණ පහක් සඳහක් කර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (1) ගලීල මුහුද හැඳින් වූ තවත් නම් දෙකක් ලියන්න.

(2) ශ්‍රාවකයන් දොළොස් දෙනා පිටත් කර හැරීමේ දී ජේසුස් වහන්සේ ඔවුන්ට පැවරූ කාර්යයන් තුනක් නම් කරන්න.

(3) දොළොස් දෙනා හා හැත්තෑ දෙනා පිටත් කර හැරීමේ ධර්මදූත චාරිකා දෙක මගින් කිතුණු සේවයට වැදගත්වන කාරණා පහක් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (1) ජේසුස් වහන්සේට පරීක්ෂාවන් පැමිණියේ කොහේදී ද? පැමිණි පරීක්ෂා ගණන කීය ද?

(2) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ලියා ඒවාට උන් වහන්සේ දුන් පිළිතුරු ලියා දක්වන්න.

(3) වර්තමාන සමාජයේ දී ඔබට මුහුණ දෙන්න වන පරීක්ෂා පහක් ලියා ඒවා ජයගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (1) ජේසුස් වහන්සේගේ කාලයේ ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය දැරුවේ කවුරුන් ද? ඔහුගේ නම කුමක් ද?

(2) පිලාත් ඉදිරිපිට ජේසුස් වහන්සේට විරුද්ධව ඉදිරිපත් වූ චෝදනා තුන මොනවා ද?

(3) ජේසුස් වහන්සේගේ දුක්විඳීමට සම්බන්ධ පුද්ගලයින් පස් දෙනෙකු නම්කර ඔවුන්ගේ දිවියෙන් ඔබගේදිවියට ලැබෙන මග පෙන්වීම් පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත මාතෘකා අතරින් දෙකක් පමණක් තෝරාගෙනන දී ඇති සැකිල්ලට අනුව කෙටි සටහන් ලියන්න.

(1) මුල් ශ්‍රාවකයින් කැඳවීම.

- ★ කැඳ වූ ස්ථානය.
- ★ පළමු ව කැදවනු ලැබූ අය.
- ★ ජේසුස් වහන්සේ ප්‍රථම ගෝලයාට පැවසූ වදන්
- ★ ඔහුගේ ප්‍රතිචාරය
- ★ ඔබගේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශයක්

(2) ජේසුස් වහන්සේගේ බෞතීස්මය.

- ★ බෞතීස්ම ලැබූ ස්ථානය.
- ★ ජේසුතුමා බෞතීස්මය ලැබුයේ කාගෙන් ද?
- ★ එහි දී සිදු වූ විශේෂ සිදුවීම.
- ★ අහසින් ඇසුනු හඬ ශබ්දය.
- ★ බෞතීස්මයේ වැදගත්කම.

(3) දේව මාළිගාව පවිත්‍ර කිරීම.

- ★ ජේසුස් වහන්සේ දේව මාළිගාවට පැමිණි ආකාරය.
- ★ උන් වහන්සේ එහි දී ක්‍රියා කළ ආකාරය.
- ★ උන් වහන්සේ ඒ මොහොතේ දී පැවසූ වදන්
- ★ එම වදන්වල අර්ථය
- ★ ඒ මගින් කිතුණු අපට ලබා දෙන පණිවිඩය.

(4) අවුරුදු 12 දී ජේසුතුමා දේව මාළිගාව යෑම.

- ★ දේව මාළිගාව ගිය හේතුව.
- ★ එහි දී ජේසුකුමරු කළ ක්‍රියාව.
- ★ ජේසු කුමරු මවට පැවසු වදන්
- ★ එම වදන්වල වැදගත්කම.
- ★ එම සිද්ධියෙන් අපට ලබා ගතහැකි ආදර්ශයන්

(ලකුණු 5 + 5 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 3 ) | 03. ( 1 ) | 04. ( 3 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 4 ) | 08. ( 1 ) | 09. ( 2 ) | 10. ( 2 ) |
| 11. ( 1 ) | 12. ( 3 ) | 13. ( 1 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 3 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 1 ) | 20. ( 2 ) |
| 21. ( 2 ) | 22. ( 3 ) | 23. ( 1 ) | 24. ( 4 ) | 25. ( 4 ) | 26. ( 2 ) | 27. ( 1 ) | 28. ( 2 ) | 29. ( 4 ) | 30. ( 2 ) |
| 31. ( 4 ) | 32. ( 3 ) | 33. ( 1 ) | 34. ( 2 ) | 35. ( 4 ) | 36. ( 3 ) | 37. ( 1 ) | 38. ( 3 ) | 39. ( 4 ) | 40. ( 2 ) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (1) මරියතුමිය / ජෝසෙප් තුමා
(2) චර්මච්ඡේදනය / කැප කිරීම. / කුළුදුල් පිරිමි දරුවන් වසය අවුරුදු : 12 දී දේව මාළිගාවට යෑම
(3) ජුදය / ගලීලය / ඉතුරය / ත්‍රිකෝනිය / අබිලේනය
(4) වන මී හා පළගැටියන් ආහාරයට ගැනීම. / පාළුකරයේ විසීම ඔටුලොම් වස්ත්‍ර ඇඳ ඉණ පටියෙන් බැඳ සිටීම.
(5) ''වෙදතුමාණෙනි ඔබ ම සුවකරගන්න''
''ගමේ දිවැසිවරයා ගමට අගේ නැත.''
(6) දෙදෙනා බැගින් යන්න. / කලින් සැලසුම් කර ප්‍රදේශ තෝරා ගන්න. / පසුම්බියක්, මල්ලක්, පාවහන් නොගෙනියන්න. / පිළිගන්න අය සමඟ නතරවන්න. / පිළිනොගන්න තැන්වලින් දූවිලි ගසා දමන්න.
(7) ආබ්‍රහම්ගේ පුත්‍රයා - සාකෙවුස්
ආබ්‍රහම්ගේ දියණිය - කුදු ස්ත්‍රීය
(8) රෝම රජයට බදු ගෙවීම. / දේව මාළිගාවට බදු ගෙවීම.
(9) ජේසුස් වහන්සේ විසින් පේදුරුට
(10) ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය.''

(ලකුණු 2 × 10 = 20)

02. (1) ගාබියෙල් දේවදූතයා විසින් සෙකරියස් පූජකතුමාට
(2) (අ) දේව මාළිගාවේ අතිශුද්ධස්ථානයේ ය.
(ආ) සුවඳ දුම් පූජාව ඔප්පු කරමින් සිටියේ ය.
(ඇ) සෙකරියස් පූජකතුමා ගොළුවීම.
(3) තරාතිරම් නොබැලීම. / නිහතමානී වීම. / සේවය අවශ්‍ය අය සඳහා අවධානය යොමු කිරීම වැනි සිසුන් ලියා ඇති පිළිතුරු අනුව ලකුණු දෙන්න.

(ලකුණු 2+ 3 + 5 = 10)

03. (1) පිලිප් විසින් ඓතියෝපීය නපුංසකයාට
(2) සේවකත්වය / කීකරුකම / යටහත් පහත් බව / පරිත්‍යාගශීලී බව
(3) සිසුවා ලියා ඇති පිළිතරු සලකා බලන්න.

(ලකුණු 2+ 3 + 5 = 10)

04. (1) තිබේරියස් මුහුද / ගෙනසරත් විල
(2) යක්ෂයාගේ බලය හා සියලු අධිපත්‍ය කෙරෙහි බලය. / රෝග සුව කිරීමේ වරම. / දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම.
(3) ★ සුබ අස්න ප්‍රමාද නොවී ප්‍රකාශ කළ යුතු බව.
★ අභියෝගවලට මුහුණ දීමට සිදුවන බව.
★ චාම් දිවිපෙවතක් ගතකළ යුතු වීම.
★ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ක්‍රියා කිරීම.
★ සාමය පැතිය යුතු වීම ආදි පිළිතුරු

(ලකුණු 2+ 3 + 5 = 10)

05. (1) පාළුකරයේ දී / පරීක්ෂා තුනයි.
(2) ★ ''මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව - මිනිසා කෑමෙන් පමණක් ජීවත් නොවන්නේ ය.''
★ උන් වහන්සේ උස් තැනකට පමුණුවා සියලු රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු අධිපත්‍යය ද යස ඉසුරුද ඔබට දෙන්නමේ මා ඉදිරියේ නමස්කාර කරන්න. - නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න උන් වහන්සේට පමණක් සේවය කරන්න.
★ ජෙරුසලමේ දේව මාළිගාවේ කොත මුදුනින් සිටුවා ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහළට පනින්න - නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරව.
(3) අයුතු ලෙද ධනය ඉපැයීම. / මත්ද්‍රව්‍ය වලට යොමු වීම. / රණ්ඩු කිරීම. / සොරකම් කිරීම. /නිලතල ලැබීමට උනන්දු වීම වැනි පිළිතුරු.
පරීක්ෂා ජයගැනීමට දේව වචනය අනුව ජීවත් වීම / තමාට ඇති දේවල් නැති අය සමඟ බෙදා ගැනීම. / අන් අය කෙරෙහි සංවේදී වීම වැනි ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

(ලකුණු 2+ 3 + 5 = 10)

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

06. (1) උත්තම පූජකයා - කායපස්

(2) ★ ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම.
★ අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම.
★ තමා ක්‍රිස්තුස් නම් රජකු බව ප්‍රකාශ කිරීම.

(3) ★ සිරේනියේ සීමොන් / ස්ත්‍රීන් / සොරුන් / මුර සෙබළුන් / අරමාතියේ ජෝසෙප්
★ අප නොසිතන මොහොතක දේව රාජ්‍යයේ මෙහෙවරට දායක වීමට ඇරයුම් ලැබිය හැකි බව.
★ ජේසුස් වහන්සේ කුරුසිපත් වීම පරාජයක් නොව විජයග්‍රහයක් බව.
★ ජීවිතයේ අවසන් මොහොතේ වුව ද වරද පිළිගෙන පසුතැවිලි වීමෙන් කමාව ලද හැකි බව.
★ දේව වචනයෙන් ශක්තිමත්ව අභියෝගවලට මුහුණ දීමට හැකි බව.
★ ඕනෑම අවස්ථාවක සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව වැනි පිළිතුරු

(ලකුණු 2+ 3 + 5 = 10)

07. (1) මුල් ශ්‍රාවකයින් කැඳවීම.
★ ගලීලය මුහුද අසල දී
★ සීමොන් පේදුරු, ජාකොබ්, ජොහන්, ඇන්ඩෲ
★ පේදුරුට ''දියඹට ගොස් දැල් හෙලන්නයැයි'' පැවසී ය.
★ උන් වහන්සේගේ පාද පා මුල වැද වැටි තමා පව්කාර මනුෂ්‍යයකු බව පවසමින් තම දුර්වල පාපි ස්වභාවය පිළිගැනීම.
★ ජේසුස් වහන්සේට කීකරු වීම, තම පාපී බව තේරුම් ගෙන ක්‍රියා කිරීම,ජේසුස් වහන්සේ අනුගාමී වීම තුළින් තම ජීවිතය දිනා ගැනීම.

(2) ජේසුස් වහන්සෙගේ බෞතීස්මය.
★ ජොර්දාන් ගඟෙන් බෞතීසම ලැබීම.
★ ස්නාවක ජොහාන්ගේ බෞතීස්ම ලැබූ බව.
★ ශුද්ධාත්මයාණණ් වහන්සේ පරවියකුගේ රූපකාරයෙන් උන් වහන්සේ කෙරෙහි පහළ වීම.
★ ''මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාණෝ ය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි.''
★ ජලය බාහිර ජීවිතය පවිත්‍ර කරන අතර ශුද්ධාත්මවරයාණන් වහස්සේ අපගේ අභ්‍යන්තරය පවිත්‍රකරමින් මුලු ජීවිත පැවැත් ම ආලෝකමත් කරන සේක. නව ජීවිත පැවැත්මක් ඇති වේ.

(3) දේව මාළිගාව පවිත්‍ර කිරීම.
★ ''නැවුම්'' කොටළුවකු පිට ජනතාවගේ ප්‍රීති ඝෝෂා මැද රාජ තේජසින්.
★ දේව මාළිගාවේ වෙළඳාම් කරමින් සිටි අයට කස පහර දී එහි සිටි වෙළඳුන් පලවා හැරීම.
★ ''මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක් යැයි ලියා ඇත. එහෙත් නුඹලා එය සොරුන්ගේ ගුහාවක කර තිබේ.''
★ දේව මාළිගාව ශුද්ධ ලෙස පවත්වාගත යුතු ය. වංචනික ක්‍රියාවලින් තොර විය යුතුය.
★ කිතුනු අප ධර්මිෂ්ඨව ජීවත් විය යුතුය.

(4) අවුරුදු 12 දී ජේසුතුමා දේව මාළිගාවට යෑම.
★ පාස්කු මංගල්‍යයට සහභාගී වීම සඳහා
★ ජේසුස් වහන්සේ දේව මාළිගාවේ පඬිවරුන් සමග වැඩ හිඳිමින් ප්‍රශ්න විචාරමින් සාකච්ඡා කරමින් සිටිම.
★ ''ඔබ මා සෙවුවේ මන් ද? මා පියාණන්ගේ මැදුරෙහි සිටිට යුතු බව ඔබ නොදන්නෙ හි ද?
★ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ තම පියාණන් වහන්සේ බව හඳුනාගෙන සිටීම. උන් වහන්සේ ළමා කාලයේ සිටම දේව රාජ්‍යයේ මෙහෙවර පිළිබඳ අවබෝධයකින් සිටි බව.
★ අප ද කුඩා කළ සිටම දෙවියන් වහන්සේ පියාණන් බව තේරුම් ගැනීම. දේව රාජ්‍ය නගා සිටිවීමට ක්‍රියා කිරීම.

(ලකුණු 5 + 5 = 10)